# මූලික පොත්, පාලන ගිණුම් හා ශේෂ පිරික්සුම 01 කොටස

## AAT අදියර I

## FAC - මූල්‍ය ගිණුම්කරණය


සංදීප ජයසේකර

MBA (PIM-SJP), B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Visiting Lecturer – Colombo University



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd

Pioneers in Professional Education

65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

JMC vLearning
"your virtual learning partner"

# AAT 01 – මූල්‍ය ගිණුම්කරණය

## පරිච්ඡේදය - 03
## ගිණුම්කරණ ක්‍රියාවලිය

Sandeepa Jayasekera

MBA (PIM-SJP), B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Visiting Lecturer – Colombo University

JMC vLearning "your virtual learning partner"

## ගිණුම්කරණ ක්‍රියාවලිය ගැන ටිකක් මතක් කරගමු



JMC Jayasekera Management Centre (Pvt) Ltd

# ගිණුම්කරණ ක්‍රියාවලිය



ව්‍යාපාරයක ගනුදෙනු සහ සිදුවීම්, හඳුනාගැනීම, වාර්තා කිරීම, වර්ගීකරණය කිරීම, සාරාංශ කිරීම සහ මූල්‍ය ප්‍රකාශ ලෙස ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයන්ට වාර්තා කිරීම වෙනුවෙන් නිර්මාණය වූ එකිනෙක හා බැඳුණු ක්‍රියාකාරකම් එකතුව ගිණුම්කරණ ක්‍රියාවලිය වේ



# ගිණුම්කරණ ක්‍රියාවලිය

| යෙදවුම් | තොරතුරු රැස් කිරීම | තොරතුරු වාර්තා කිරීම | තොරතුරු වර්ගීකරණය කිරීම | තොරතුරු සාරාංශ කිරීම | තොරතුරු අර්ථකතනය කිරීම | තොරතුරු සන්නිවේදනය කිරීම | නිමැවුම |
|---|---|---|---|---|---|---|---|
| ගනුදෙනු සහ සිදුවීම් | මූලාශ්‍ර ලේඛණ | මූලික පොත් | පොදු ලෙජරය | ශේෂ පිරික්සුම සහ මූල්‍ය ප්‍රකාශ | අනුපාත | වාර්ෂික වාර්තාව | මූල්‍ය ප්‍රකාශ |

# මූලාශ්‍ර ලේඛණ



JMC Jayasekera Management Centre (Pvt) Ltd

JMC vLearning
"your virtual learning partner"

# මොනවාද මේ මූලාශ්‍ර ලියවිලි කියන්නේ?

යම් ගනුදෙනුවක් හෝ සිදුවීමක් සිදු වූ පසු එය සිදු වූ බව තහවුරු කිරීමට නිකුත් කරන ලියවිල්ල මූලාශ්‍ර ලියවිල්ලක් වේ.
මූලාශ්‍ර ලියවිල්ල තුලින් ගනුදෙනුව පිළිබඳ තොරතුරු රැස් කරන අතර, එය ගනුදෙනුව සිදු වූ බවට සාක්ෂියක් ලෙස කටයුතු කරයි.


මූලාශ්‍ර ලියවිලි,


1. ගනුදෙනුවක් සිදු වූ බවට සාක්ෂියක් ලෙස කටයුතු කරයි
2. ගනුදෙනු වාර්තා කිරීමට උපකාරක ලියවිල්ලක් ලෙස කටයුතු කරයි
3. ගනුදෙනුවක් බලාත්මක කිරීමට මූලාශ්‍ර ලියවිලි භාවිතා කරයි

සාක්ෂියක්

උපකාරක ලියවිල්ලක

බලාත්මක කිරීම


දිනය
ව්‍යාපාරයේ නම සහ ලිපිනය
ලියවිල්ලේ අනු අංකය
අනුමත කරන්නාගේ අත්සන
මූලාශ්‍ර ලියවිලිවල ඇතුලත් තොරතුරු
ලබන්නාගේ නම සහ ලිපිනය
ගෙවීම් කොන්දේසි
මුළු වටිනාකම
භාණ්ඩ පිළිබඳ තොරතුරු (ස්වාභාවය, ප්‍රමාණය සහ මිල )


විකුණුම් ඉන්වොයිසිය
ගැනුම් ඉන්වොයිසිය
ලදුපත
ජර්නල් වව්චරය
මූලාශ්‍ර ලියවිලි
මුදල් ගෙවීම් වව්චරය
සුළු මුදල් වව්චරය
හරපත
බැරපත

| මුලාශ්‍ර ලියවිල්ල | ගනුදෙනු | නිකුත් කළේ | ලැබුයේ | මූලික පොත |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

| මුලාශ්‍ර ලියවිල්ල | ගනුදෙනු | නිකුත් කරන්නා | ලබන්නා | මූලික පොත |
|---|---|---|---|---|
| මුදල් ලදුපත් | මුදල් ලැබීම් | මුදල් අයකැමි | මුදල් ගෙවන පාර්ශවයට | මුදල් ලැබීම් ජර්නලය |
| මුදල් ගෙවීම් වව්චරය | මුදල් ගෙවීම් | මුදල් ගෙවුම්කරු (ගණකාධිකාරී) | මුදල් ලබන පාර්ශවයට | මුදල් ගෙවීම් ජර්නලය |
| සුළු මුදල් වව්චරය | සුළු මුදල් වියදම් | සුළු මුදල් භාරකරු | මුදල් ගෙවන පාර්ශවයට | සුළු මුදල් ගෙවීම් ජර්නලය |
| විකුණුම් ඉන්වොයිසිය | ණයට ගැනුම් | විකුණුම්කරු | පාරිභෝගිකයාට | විකුණුම් ජර්නලය |
| බැරපත | විකුණුම් ආපසු එවුම් | පාරිභෝගිකයා | විකුණුම්කරුට | ආපසු එවුම් ජර්නලය |
| ගැනුම් ඉන්වොයිසිය | ණයට ගැනුම් | සැපයුම්කරු | ව්‍යාපාරය | ගැනුම් ජර්නලය |
| හරපත | ගැනුම් ආපසු යැවුම් | ව්‍යාපාරය | සැපයුම්කරු | ආපසු යැවුම් ජර්නලය |
| ජර්නල වව්චරය | අනිකුත් සියළුම ගනුදෙනු | ව්‍යාපාරය (ගණකාධිකාරී) | විවිධ පාර්ශව | පොදු ජර්නලය |

JMC vLearning "your virtual learning partner"



# මූලාශ්‍ර ලියවිලි




# ලදුපත (බිල්පත/මෙමෝව)

විවිධ ආකාරවලින් ව්‍යාපාරයට ලැබෙන මුදල්, ව්‍යාපාරය ලද බවට තහවුරු කරමින් ව්‍යාපාරය විසින් එම මුදල් ලබා දෙන පාර්ශව සඳහා නිකුත් කරන ලියවිල්ල ලදුපතක් වේ.

මුදලින් වේවා, චෙක්පතකින් වේවා, ප්‍රේෂණයකින් වේවා, කාඩ්පත් තුලින් ලද මුදල් යනාදි විවිධ ආකාරවලින් ලැබෙන සෑම මුදල් ලැබීමක් සඳහාම ලදුපතක් නිකුත් කෙරේ.

විවිධ මුදල් ලැබීම් සඳහා උදාහරණ

- අත්පිට විකුණුම්
- ණයගැති ලැබීම්
- ප්‍රාග්ධනය ලැබීම්
- කුළී ආදායම් ලැබීම්


KOMSEKY (Pvt) LTD.

Tel : 0112 335 194
Fax : 0112 473 833
E-mail : komseky@gmail.com

143

No: 65/3,
Sir Chittampalam A. Gardiner Mawatha,
Colombo - 2

Date 2022.02.23

Received with thanks from J M C Jayasekera Management Centre (Pvt) Ltd
of
a sum of Rupees Thirty Six Thousand only
and cents Rs. 36,000/= on account of Annual Return filing Charges and Returns fees 2021

Rs. 36000/= Cash

All Cheques Subject to Realization.



JMC vLearning "your virtual learning partner"


# මුදල් ගෙවීම් වව්චරය

ව්‍යාපාරය විසින් සිදුකරනු ලබන සෑම ගෙවීමක්ම ගෙවූ බවට සහතික කිරීම සඳහා ව්‍යාපාරය විසින් පිළියෙල කරනු ලබන ලියවිල්ල මුදල් ගෙවීම් වව්චරය වේ.

මුදල් ගෙවීම්, චෙක්පත් ගෙවීම්, සෘජු ප්‍රේෂණ මගින් කරන ගෙවීම්, කාඩ්පත් මගින් කරන ගෙවීම් යනාදී සෑම ගෙවීමක් සඳහාම මුදල් ගෙවීම් වව්චරයක් නිකුත් කෙරේ.

විවිධ මුදල් ලැබීම් සඳහා උදාහරණ

- අත්පිට ගැනුම්
- ණයහිමි ගෙවීම්
- වියදම් ගෙවීම්
- ණය ගෙවීම්
- ගැනිලි
- දේපළ මිලදී ගැනීම්



2

**PAYMENT VOUCHER**

COMPANY NAME ABC
No 12, Jalan Petaling Maju, 40000 Shah Alam Selangor
Phone: 013456789 E-Mail: abc@gmail.com

| | | | |
|---|---|---|---|
| Payee Name | Ali Maju Sdn Bhd | PV No | PV0001 |
| SSM No / IC No | SA002345A | Due Date | 30/10/2021 |
| Bank Name | CIMB | Payment Method | Online Transfers |
| Account No | 86039488787 | | |

| No | Payment Details | Amount (RM) |
|---|---|---|
| 1 | Bayaran Invoice Payroll V2 + Slip Gaji | 150.00 |
| 2 | Rekod Jualan Excel | 80.00 |
| | Total (RM) | 230.00 |

*Remarks*

| Prepared By | Approved By | Received By |
|---|---|---|
| Lisa 30/10/2021 | Anis 30/10/2021 | 30/10/2021 |



# ඉන්වොයිසිය

## ණයට ගැනුම් සහ ණයට විකුණුම්

ගැනුම්කරුට ඉන්වොයිසියක් ලැබේ.




විකුණුම්කරු ඉන්වොයිසිය නිකුත් කරයි.

JMC vLearning your virtual learning partner

# ඉන්වොයිසිය

ලෝකයේ බහුතරයක් ව්‍යාපාර ක්‍රියාත්මක වන්නේ ණයට විකුණුම් සහ ණයට ගැනුම් මත වේ. ණයට විකුණුමක් සහ ණයට ගැනුමක් සිදු වූ බවට තහවුරු කිරීම සඳහා අදාළ විකුණුම් කරන පාර්ශවය විසින් ණයට ගන්නා පාර්ශවය වෙත නිකුත් කරන ලියවිල්ල ඉන්වොයිසියක් වේ.



CUSTOMER COPY
TAX INVOICE
CREDIT
ISO 9001 - 2008 Certified Company
COPY

NIPPON PAINT LANKA (PVT) LTD
Member of NIPSEA Group
Colombo Office : Nippolac Towers, No. 69 A, Buthgamuwa Road, Rajagiriya. Tel: 011-4356900 - 8 Fax: 011-4356909
Matara Office : 67, Kumaradasa Mawatha, Matara. Tel: 041-4933530 - 8 Fax: 041-4390436
www.nipponpaint.com.lk
Technical Center : Tel : 011-4449488

INVOICE NO.: 2701068877
JMC JAYASEKARA MAANAGEMENT CENTRE (PVT) LTD
65/2A,
CHITTAMPALAM GARDINER MW,
COLOMBO 02
DEALER CODE : 3010000860 P.O.NO.: KDU-19(01)

Serial No : 1176823
DATE : 26.02.2019
ORDER NO. : 2689052016
DELIVERY NOTE : 2695075363
REP.CODE : 00000116
P.O. NO. : KDU-19(01)
NBT REG.NO. 104024890 - 9000
VAT REG.NO. 104024890 - 7000
SVAT NO. 003665

| TEM CODE | DESCRIPTION | BATCH NO. | QTY. | RATE | VALUE |
|---|---|---|---|---|---|
| PTPTSTU0008 | NIPPOLAC SUPER TURPENTINE 2LT | 1101565717 | 4 | 880.00 | 3,520.00 |
| | | Gross Value | | | 3,520.00 |
| | | Less Discount ( | | 25.00-%) | ( 880.00-) |
| | | Subtotal | | | 2,640.00 |
| | | Grand Total | | | 2,640.00 |



JMC vLearning "your virtual learning partner"

# 2019 ජනවාරි 1.12

ඉන්වොයිසියක ඇතුලත් විය යුතු වැදගත් කරුණු 3ක් දක්වන්න

## 2022 ජනවාරි 1.2


සමන් ව්‍යාපාරය රුපියල් 85,000/- ක් වටිනා භාණ්ඩ සුනිල් හට ණයට විකුණන ලදි
ඉහත ගනුදෙනුව සටහන් කිරීම සඳහා සමන් ව්‍යාපාරය විසින් නිකුත් කරන ලද නිවැරදි මූලාශ්‍ර ලේඛණය වන්නේ

1. මිලදී ගැනීමේ ඉන්වොයිසිය
2. ගෙවීම් වවුචරය
3. විකුණුම් ඉන්වොයිසිය
4. හර සටහන



JMC vLearning
"your virtual learning partner"

## විකුණුම් ආපසු එවුම් සහ ගැනුම් ආපසු යැවුම්




විකුණන ලද භාණ්ඩ පාරිභෝගිකයා විසින් නැවත හරවා ව්‍යාපාරයට එවිය හැකි අතර ඒවා විකුණුම් ආපසු එවුම් ලෙස සළකයි. ණයට ගන්නා ලද භාණ්ඩ නැවත හරවා සැපයුම්කරුට යැවිය හැකි අතර ඒවා ගැනුම් ආපසු යැවුම් ලෙස සළකයි.


# භාණ්ඩ හරවා එවීමට හෝ යැවීමට හේතු වන කරුණු



එකඟ වූ මිලට වඩා වැඩි මිලක් අය කිරීම




පොරොන්දු වූ වෙළඳ වට්ටම් නොලැබීම.



භාණ්ඩ නරක් වී තිබීම හෝ හානි වී තිබීම.




බලාපොරොත්තු වූ ගුණත්වය භාණ්ඩ තුල නොතිබීම.

Sandeepa Jayasekera - JMC 19

# හරපත

ගැනුම් ආපසු හරවා යැවීමේදී නිකුත් කරන මූලාශ්‍ර ලියවිල්ල හරපතකි. භාණ්ඩ ණයට ගත් ගන්නා විට ණයහිමියා වැඩිවේ. එසේ ණයට ගත් භාණ්ඩ ආපසු හරවා යවන විට ණයහිමි ශේෂය අඩු කළ යුතුය. ණයහිමි ශේෂය අඩු කිරීමට හෙවත් හර කිරීමට හරපත නිකුත් කෙරේ.



Debit Note

Debit Note# CDN-000004

Zylker India,
44 Annasalai,
Chennai 600002, India.

GSTIN: 33GSPTN0371G1ZD
Phone: 98573829384
PAN 312456789

Balance Due
₹103.00

Bill To
Ambit Depots,
10 Thakur Street, Chennai 600450
Tamil Nadu, India.

GSTIN: 33GSPKA0371G1FE
Phone: 982309583
Circuit ID: 57686533GSPKA0371G1FE

Debit Note Date : 05 Sep 2017
Terms : Due on Receipt
Due Date : 05 Sep 2017
Reference Invoice# : PC106
Reference Invoice Date : 03 Aug 2017

Place Of Supply: Tamil Nadu (33)

| # | Item & Description | Rate | CGST | SGST | Amount |
|---|---|---|---|---|---|
| 1 | Item rate adjusted | 100.00 | 1.50 1.5% | 1.50 1.5% | 100.00 |

| | |
|---|---|
| Sub Total | 100.00 |
| CGST 1.5 (1.5%) | 1.50 |
| SGST 1.5 (1.5%) | 1.50 |
| Total | ₹103.00 |
| Balance Due | ₹103.00 |

Sandeepa Jayasekera - JMC 20

JMC vLearning "your virtual learning partner"

# 2019 ජනවාරි 1.3

හරපතක් යනු,

1. සමහර හේතු නිසාවෙන්, ආපසු යැවූ භාණ්ඩවල වටිනාකම අඩුකරමින්, ගැනුම්කරු විසින් විකුණුම්කරු වෙත, නිකුත්කරනු ලබන ලියවිල්ලකි
2. පෙර ඉන්වොයිසියක කොන්දේසි යටතේ ගැනුම්කරු විසින් විකුණුම්කරු වෙත ගෙවිය යුතු වටිනාකම අඩුකරමින් විකුණුම්කරු විසින් ගැනුම්කරු වෙත නිකුත්කරනු ලබම ලියවිල්ලකි
3. පාර්ශවයන් දෙකක් අතර සිදුවූ මූල්‍යමය ගනුදෙනුවකට සාක්ෂියක් වශයෙන් භාවිතා කළ හැකි ලියවිල්ලකි
4. අස්තිත්වයට මුදල් ලැබුණු බව ඔප්පු කිරීමට, ව්‍යාපාරයේ වගකිවයුතු තැනැත්තෙකු විසින් නිකුත් කරනු ලබන ලියවිල්ලකි.



JMC vLearning "your virtual learning partner"

# 2021 ජූලි 1.7

ණයට මිලදිගත් භාණ්ඩ, ආපසු හරවා යැවීමේදී ගැනුම්කරුවෙකු විසින් භාවිතා කරනු ලබන මූලාශ්‍ර ලියවිල්ල වන්නේ

1. බැරපතයි
2. ගැනුම් ඉන්වොයිසිය
3. ගැනුම් ඇණවුමයි
4. හරපතයි

# 2023 ජුලි 1.9

ණය පදනමට මිලදී ගත් භාණ්ඩ සැපයුම්කරු වෙත ආපසු යැවීම සඳහා ගැනුම්කරු විසින් භාවිතා කරනු ලබන නිවැරදි මූලාශ්‍ර ලියවිල්ල තෝරන්න


1. හරපත
2. බැරපත
3. ගැණුම් ඇණවුම
4. ජර්නල් වවුචරය

02 Marks



# බැරපත

පාරිභෝගිකයෙකු වෙත ණයට විකුණන ලද අයිතමයන් නැවත හරවා එවන විට බැර පතක් නිකුත් කෙරේ.
ණයට විකුණුමක් කරන විට ණයගැති වත්කම වැඩිවේ, එනම් ණයගැතියා හර වේ. එම ණයට විකුණුමක් නැවත හරවා එවන විට ණයගැති ශේෂය අඩුවේ, එනම් බැර වේ. ණයගැති ශේෂය බැර කිරීම සඳහා විකුණුම් ආපසු එවුම් සඳහා බැරපත නිකුත් කෙරේ.


[Your Logo] [Your Web Address]

CREDIT NOTE

Date: 1st October 2012
Credit Note Number: CN-0001
VAT Number: GB12345678

[Your Company Name]
[Address 1]
[Address 2]
[City]
[Town]
[Postcode]

[Customer Name]
[Customer Address 1]
[Customer Address 2]
[Customer Town]
[Customer City]
[Customer Postcode]

| Description | Quantity | Price | Amount |
|---|---|---|---|
| Faulty Widgets on Invoice INV-0001 | 2 | 10.00 | 20.00 |
| Service One - Partial Refund (Hours) | 3 | 40.00 | 120.00 |
| | | Subtotal | 140.00 |
| | | **TOTAL** | **140.00** |



JMC vLearning "your virtual learning partner"

## 2022 ජූලි 1.7

ගැනුම්කරුවෙකු විසින් ණයට ගත් භාණ්ඩ ආපසු හරවා එවීමේදී විකුණුම්කරු විසින් භාවිතා කරනු ලබන නිවැරදි මුලාශ්‍ර ලියවිල්ල

1. ගැණුම් ඇණවුම
2. ජර්නල් වවුචරය
3. හරපත
4. බැරපත



## 2021 ජනවාරි 1.15

පහත ප්‍රකාශය සත්‍යද අසත්‍යද යන්න සඳහන් කරන්න


දේපළ, පිරියත සහ උපකරණ ණයට මිලදී ගැනීම වාර්තා කිරීමට භාවිතා කරනු ලබන මුලාශ්‍ර ලියවිල්ල වන්නේ ගැනුම් ඉන්වොයිසියයි.



JMC vLearning your virtual learning partner"

# සුළු මුදල් වව්චරය

ව්‍යාපාරයක එදිනෙදා මුදලින් කෙරෙන වියදම් සඳහා සුළු මුදල් අග්‍රිමයක් පවත්වාගෙන යනු ලබයි. එම සුළු මුදල් අග්‍රිමය තුලින් කෙරෙන ප්‍රවාහන, සුභසාධන, තැපැල්, පිරිසිදු කිරීම්, නඩත්තු වියදම් සඳහා නිකුත් කෙරෙන මූලාශ්‍ර ලියවිල්ල වන්නේ සුළු මුදල් වව්චරයයි. මෙය සුළු මුදල් භාරකරු විසින් වියදම සිදු කරන පාර්ශවයට නිකුත් කරනු ලබයි





Sandeepa Jayasekera - JMC

27

# ජර්නල් වව්චරය

පෙර සඳහන් කළ මූලාශ්‍ර ලියවිලිවල සටහන් කෙරෙන ගනුදෙනු හැර අනිකුත් සෑම ගනුදෙනුවක් සඳහාම නිකුත් කෙරෙන මූලාශ්‍ර ලියවිල්ල ජර්නල් වව්චරයයි.
බොල්ණය, ක්ෂය, ස්ථාවර වත්කම් ණයට මිලදී ගැනීම්, ගෙවිය යුතු වියදම් යනාදී ගනුදෙනු මෙහි වාර්තා කරයි.



**Global Building, PT**
Jl. Wijaya 1 No. 88
Kebayoran Baru
Jakarta Selatan

Journal Voucher
Voucher No. : **1069**
Date : **30 Jun 2008**

| Account No. | Account Name | Debit | Credit | Memo |
|---|---|---|---|---|
| 1101-004 | Bank EURO | 6.800.000 | 0 | |
| 3300 | Opening Balance Equity | 0 | 6.800.000 | |

Say : Six million eight hundred thousand

**Debits :** 6.800.000
**Credits :** 6.800.000

Description
Account opening balance 1101-004

Prepared By Reviewed By Approved By

Date: Date: Date:

Sandeepa Jayasekera - JMC

28

JMC vLearning
"your virtual learning partner"

## 2023 ජූලි 1.12

පහත ප්‍රකාශය සත්‍යද අසත්‍යද යන්න සඳහන් කරන්න

බැරපත, ව්‍යාපාර අස්තිත්වයක මුලාශ්‍ර ලියවිල්ලක් සඳහා උදාහරණයක් වේ.

02 Marks



JMC vLearning "your virtual learning partner"

## 2024 ජනවාරි 1.16

පහත සඳහන් ගනුදෙනු සඳහා භාවිතා කරන මුලාශ්‍ර ලියවිල්ල දක්වන්න

1. කාර්යාලයේ භාවිතය සදහා රු.200,000/- කට පරිගණකයක් ණයට මිලදී ගැනීම
2. සීමාසහිත ABC සමාගමට රු.600,000/- ක භාණ්ඩ ණයට විකිණීම.

02 Marks

## 2018 ජූලි 1.14

XYZ ට්‍රේඩර්ස්හි පහත සඳහන් එක් එක් ගනුදෙනු වාර්තා කිරීම සඳහා භාවිතා කල යුතු මුලාශ්‍ර ලියවිල්ල දක්වන්න

1. රු.15,000/- වටිනා ලිපිද්‍රව්‍ය මුදලින් මිලදී ගැනීම
2. ණයට ගත් රු.400,000/- ක තොග තත්වයෙන් අඩුවීම නිසා සැපයුම්කරු වෙත හරවා යැවීම
3. රු. 20,000/- ක් වටිනා අයිතම, සීමාසහිත ABC සමාගමට ණය පදනම මත විකිණීම
4. කාර්යාලයේ භාවිතය සඳහා, සීමාසහිත PQRS සමාගමෙන් රු. 400,000/- ක ඡායා පිටපත් යන්ත්‍රයක් ණය පදනම මත මිලට ගැනීම .



## 2020 ජනවාරි 1.11

ABC ට්‍රේඩර්හි පහත සදහන් එක් එක් ගනුදෙනු වාර්තා කිරීමට භාවිතා කරනු ලබන මුලාශ්‍ර ලේඛණය දක්වන්න

1. ගනුදෙනුකරුවෙක් විසින් රු. 465,000/- ක මුදලකට ණය පදනම මත මිලදී ගන්නා ලද අයිතම, අඩු ගුණාත්වය නිසා විසින් ආපසු හරවා එවා තිබේ
2. ව්‍යාපාරයේ භාණ්ඩ ප්‍රවාහනය කිරීම සදහා රු.2,500,000/- කට ලොරි රථයක් ණය පදනම මත මිලදී ගන්නා ලදි
3. වෙළඳ ණයගැතියෙකුගෙන් රු. 25,000/- ක මුදලක් ලැබීම.

03 Marks



JMC vLearning "your virtual learning partner"

## වෙනත් මූලාශ්‍ර ලේඛණ

| ද්‍රව්‍ය අධියාචනා පත්‍රය | ගැණුම් අධියාචනා පත්‍රය | ගැණුම් ඇණවුම | භාණ්ඩ ලැබීම් පත්‍රය |
|---|---|---|---|
| ද්‍රව්‍ය අවශ්‍ය කරන අංශය විසින් ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ගබඩාවට නිකුත් කරන ලේඛණය. | මිලට ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය සඳහන් කරමින් ගබඩා අංශය විසින් ප්‍රසම්පාදන (මිල දි ගැනීම්) අංශය වෙත නිකුත් කරන ලියවිල්ල | ප්‍රසම්පාදන අංශය විසින් මිල දි ගන්නා භාණ්ඩ පිළිබඳ විස්තර ඇතුලත් කරමින් සැපයුම්කරු වෙත නිකුත් කරන ලියවිල්ල | සැපයුම්කරුගෙන් භාණ්ඩ ලැබුණු බවට තහවුරු කරමින් භාණ්ඩ ලැබුණු අවස්ථාවේදී ගබඩාවෙන් නිකුත් කරන ලද ලේඛණය. මිලදී ගත් භාණ්ඩ ලැබී ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා මිලදී ගැනීමේ ඇණවුම සමඟ සංසන්දනය කිරීමට මෙය භාවිතා කරයි. මෙය ගබඩා ලෙජරයේ භාණ්ඩ ලැබීම් වාර්තා කිරීමට මූලාශ්‍ර ලේඛණයක් ලෙස භාවිතා කරයි |

JMC vLearning
"your virtual learning partner"

## 2020 ජනවාරි 1.3

ව්‍යාපාරයේ ගබඩාව තුළ සමහර තොග අයිතමයන් නොමැති බව, සීනා ට්‍රේඩර්ස් හි ගබඩා භාරකරු විසින් නිරීක්ෂණය කරන ලදි.

අවශ්‍ය කරන තොග අයිතමයන් ලබා ගැනිම සඳහා මිලදි ගැනීමේ දෙපාර්තුමේන්තුව වෙත ඉල්ලීම් කිරීමට, ගබඩා භාරකරු විසින් භාවිතා කරන මූලාශ්‍ර ලියවිල්ල වන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක්ද?

1. ගැනුම් ඇණවුම
2. ජර්නල් වවුචරය
3. භාණ්ඩ ලැබීමේ පත්‍රිකාව
4. මිලදි ගැනීමේ අධියාචනා පත්‍රයයි

## 2020 ජුලි 1.8

ගබඩාවට භාණ්ඩ ලැබීම් වාර්තා කිරීම සඳහා උපයෝගී කරගන්න ලියවිල්ල වන්නේ,

1. මිලදී ගැනුම් ඇණවුමයි
2. මිලදී ගැනීමේ අධියාචනා පත්‍රයයි
3. භාණ්ඩ ලැබීමේ පත්‍රිකාවයි
4. ද්‍රව්‍ය අධියාචනා පත්‍රයයි

02 Marks



JMC vLearning "your virtual learning partner"

## 2023 ජනවාරි 1.8

පහත සඳහන් ලියවිලි අතුරෙන් සැපයුම්කරුවන්ගේන් ලැබුණු භාණ්ඩ වාර්තා කිරීමට ගබඩා භාරකරු විසින් භාවිතා කරනු ලබන මූලාශ්‍ර ලියවිල්ල වන්නේ කුමක්ද?

1. විකුණුම් ඉන්වොයිසිය
2. භාණ්ඩ ලැබීමේ පත්‍රය
3. ගැනුම් ඇණවුම
4. ගෙවීම් වවුචරය

## 2024 ජනවාරි 1.12

වර්ගය, ප්‍රමාණය, එකගවු මිල, අවශ්‍ය දිනය හා අනෙකුත් කොන්දේසි හා නියමයන් වැනි මිලදී ගැනීමට අවශ්‍ය වන භාණ්ඩවල විස්තර ඇතුළත් කර ගැනුම්කරුවෙකු විසින් පිළියෙල කරනු ලබන නිවැරදි මූලාශ්‍ර ලියවිල්ල තෝරන්න


1. ගෙවීම් වවුචරය
2. ගැනුම් ඇණවුම
3. භාණ්ඩ ලැබීම් පත්‍රය
4. ද්‍රව්‍ය අධියාචනා පත්‍රය

Sandeepa Jayasekera - JMC 37




JMC vLearning
"your virtual learning partner"

# මූලික පොත්/උපයෝගී පොත්/ප්‍රාථමික පොත්/ජර්නල්




මූලාශ්‍ර ලියවිලි

තොරතුරු වාර්තා කිරීම



මූලික පොත්







මූලාශ්‍ර ලියවිලිවලින් රැස් කරගන්නා ගනුදෙනු සහ සිදුවීම් පිළිබඳ තොරතුරු කාලනුක්‍රමිකව (දින අනුපිළිවෙලට) වාර්තා කිරීමට භාවිතා කරන ගිණුම්කරණ පොත් කට්ටලය මූලික පොත් ලෙස හදුන්වයි.
මූලික ලියවිලි වර්ග 8 සඳහා වෙන වෙනම මූලික පොත් 8ක් තිබේ. මූලික පොත්වල වාර්තා කරන තොරතුරු කාලපරිච්ඡේදයක් අවසානයේ (මාසයක්) පොදු ලෙජරයට ද්විත්ව සටහනක් ලෙස වාර්තා කරයි



JMC vLearning
"your virtual learning partner"




## 2022 ජූලි 1.2

**පහත සඳහන් ඒවා අතුරෙන්, මූලික සටහන් පොතක් නොවන්නේ කුමක්ද?**

1. මුදල් පොත
2. දෛනික ගැනුම් පොත
3. පොදු ලෙජරය
4. දෛනික විකුණුම් පොත

02 Marks

JMC vLearn

## 2022 ජනවාරි 1.12

පහත ප්‍රකාශය සත්‍යද අසත්‍යද යන්න සඳහන් කරන්න

දෛනික ගැනුම් පොතේ ගනුදෙනුවක් වාර්තා කිරීම සඳහා භාවිතා කරන මූලාශ්‍ර ලියවිල්ල, හරපත වේ.



JMC vLearning "your virtual learning partner"

## 2023 ජනවාරි 1.20

මූලික සටහන් පොත් පවත්වාගෙන යාමේ වැදගත්කම්/අරමුණු දෙකක් හදුනා දක්වන්න.

# මූලික පොත් පවත්වාගෙන යාමේ අරමුණු/වැදගත්කම



Sandeepa Jayasekera - JMC

45

# මූලික පොත් පවත්වාගෙන යාමේ අරමුණු/වැදගත්කම

- ගනුදෙනු මූලික පොත්වල වාර්තා කර, එකතුවට පමණක් පොදු ලෙජරයේ ද්විත්ව සටහනක් යොදන බැවින්, පොදු ලෙජරය සංකීර්ණ වීම අවම කරගත හැකි වීම
- දෝෂ සහ අතපසුවීම් ඉක්මනින් හඳුනාගත හැකි වීම.
- දෝෂ සහ අතපසුවීම් අවම කර ගත හැකි වීම.
- ව්‍යාපාරික ගනුදෙනු ඵලදායී ලෙස පාලනය කළ හැකි වීම.
- කාලානුක්‍රමික අනුපිළිවෙලට ගනුදෙනු සටහන් කර ඇති බැවින්, ගනුදෙනුවක් පහසුවෙන් හදුනාගත හැකි වීම



Sandeepa Jayasekera - JMC

46

JMC vLearning
your virtual learning partner

# මුදල් ලැබීම් ජර්නලය සහ මුදල් ගෙවීම් ජර්නලය

**මුදල් ලැබීම් ජර්නලය**


- ව්‍යාපාරයක සියළුම ආකාරයේ මුදල් ලැබීම් වාර්තා කිරීමට මුදල් ලැබීම් ජර්නලය භාවිතා කරයි



**මුදල් ගෙවීම් ජර්නලය**

- ව්‍යාපාරයක් විසින් චෙක්පත් සහ ප්‍රේෂණ මාර්ගයෙන් කරනු ලබන සියළුම ගෙවීම් වාර්තා කිරීමට මුදල් ගෙවීම් ජර්නලය භාවිතා කරයි

Sandeepa Jayasekera - JMC 47




JMC vLearning "your virtual learning partner"

## 2023 ජූලි 1.17

"මුදල් වට්ටම්" සහ "වෙළඳ වට්ටම්" අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.



JMC vLearning "your virtual learning partner"

## වට්ටම්

වට්ටම් යන්නෙන් අදහස් කරන්නේ වටිනාකමේ අඩු කිරීමකි.
වට්ටම් වර්ග දෙකක් තිබේ.

- වෙළඳ වට්ටම්
- මුදල් වට්ටම්



# වෙළඳ වට්ටම්

වෙළඳ වට්ටම් යනු විකුණුම් වැඩි කර ගැනීමේ අරමුණින් යම් ව්‍යාපාරයක් භාණ්ඩයක ලකුණු කළ මිලෙන් යම් වටිනාකමක් අඩු කිරීමයි. ගිණුම්කරණයේදී වෙළඳ වට්ටම් හඳුනා නොගන්නා අතර, වෙළඳ වට්ටම අඩු කළ පසු අගය විකුණුම් සහ ගැනුම් වටිනාකම් ලෙස ගිණුම් තබනු ලැබේ

| මිල දී ගැනීමකදී අඩු කරන වෙළඳ වට්ටම | විකිණීමකදී අඩු කරන වෙළඳ වට්ටම |
|---|---|
| වෙළඳ වට්ටම අඩු කළ පසු ගැනුම් වටිනාකම ගිණුම් ගත කරයි | වෙළඳ වට්ටම අඩු කළ පසු විකුණුම් වටිනාකම ගිණුම් ගත කරයි |




Sandeepa Jayasekera - JMC 51

# මුදල් වට්ටම්

මුදල් වට්ටම් යනු ණයගැතියෙකු ගෙවිය යුතු ණය මුදල එකඟ වූ ණය කාලයට පෙර පියවීම උනන්දු කරවීමට, එම ණයගැතියාගේ ණයගැති ශේෂයෙන් කරන අඩු කිරීමයි.
මුදල් වට්ටම ණයගැතියෙකුට ලබා දුන් විට එය දුන් වට්ටම් වියදමක් ලෙසත්, ණයහිමියෙකුගෙන් ලැබුණු මුදල් වට්ටම ලද මුදල් වට්ටම් ආදායමක් ලෙසත් ගිණුම් ගත කරයි

| ණයගැතියාට ලබා දුන් මුදල් වට්ටම | ණයහිමියාගෙන් ලද මුදල් වට්ටම |
|---|---|
| මුදල් ලැබීම් ජර්නලයේ දුන් වට්ටම් තීරුවේ (සිහිවටන) සටහන් කර පහත ද්විත්ව සටහන යෙදිය යුතුය | මුදල් ගෙවීම් ජර්නලයේ ලද වට්ටම් තීරුවේ (සිහිවටන) සටහන් කර පහත ද්විත්ව සටහන යෙදිය යුතුය |
| දුන් වට්ටම් (බෙදාහැරීම් වියදම්) ගිණුම හර | ණයහිමි පාලන ගිණුම බැර |
| ණයගැති පාලන ගිණුම බැර | ලද වට්ටම් (වෙනත් ආදායම්) ණය |

Sandeepa Jayasekera - JMC

සියළු මුදල් ලැබීම් වාර්තා කරයි.
විශ්ලේෂණාත්මක තීරු සමග පිළියෙල කෙරේ.

# මුදල් ලැබීම් ජර්නලය

| මුදල් ලැබීම් ජර්නලය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය | රිසට්පත් අංකය | විස්තරය | දුන් වට්ටම | එකතුව රු. | විශ්ලේෂණාත්මක තීරු | | |
| | | | | | විකුණුම් | ණයගැතියන් | වෙනත් |
| X0/3/01 | 125 | ණයගැතියෝ : භානුක | 500 | 9,500 | | 9,500 | |
| X0/3/03 | 126 | විකුණුම් | | 25,000 | 25,000 | | |
| X0/3/05 | 127 | ණයගැතියෝ : සුරෝෂ් | 1,000 | 10,000 | | 10,000 | |
| X0/3/10 | 128 | ණය ලැබීම්: BOC | | 50,000 | | | 50,000 |
| | | | 1,500 | 94,500 | 25,000 | 19,500 | 50,000 |



JMC vLearning "your virtual learning partner"

චෙක්පත් සහ ප්‍රේෂණ මගින් කරන මුදල් ගෙවීම් වාර්තා කරයි. විශ්ලේෂණාත්මක තීරු සමග පිළියෙල කෙරේ.

# මුදල් ගෙවීම් ජර්නලය

| මුදල් ගෙවීම් ජර්නලය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය | වව්චර් අංකය | විස්තරය | ලද වට්ටම් | එකතුව රු. | විශ්ලේෂණාත්මක තීරු | | |
| | | | | | ගැනුම් | ණයහිමියෝ | වියදම් |
| X0/3/01 | 125 | ගැනුම් | | 5,000 | 5,000 | | |
| X0/3/03 | 126 | ණයහිමියෝ : අක්බාර් | 1,000 | 15,000 | | 15,000 | |
| X0/3/05 | 127 | ණයහිමියෝ : නිශාන් | 2,000 | 30,000 | | 30,000 | |
| X0/3/10 | 128 | විදුලිය | | 10,000 | | | 10,000 |
| | | | 3,000 | 60,000 | 5,000 | 45,000 | 10,000 |

# ප්‍රශ්න 01

**පහන්ගේ ව්‍යාපාරයේහි අප්‍රේල් 20X7 මාසය තුළ පහත මුදල් ගනුදෙනු සිදුව තිබේ**

| | | | |
|---|---|---|---|
| 20X7/4/05 | මුදලට විකුණුම් | R.No 01 | 60,000 |
| 20X7/4/06 | විදුලි බිල්පත් ගෙවීම් | V.No. 01 | 6,000 |
| 20X7/4/08 | ණයහිමි මලින්දට ගෙවීම් | V.No. 02 | 12,000 |
| | මලින්දගෙන් ලැබුණු වට්ටමක් | | 1,000 |
| 20X7/4/10 | ගොඩනැගිලි කුලී ලැබීම් | R.No 02 | 5,000 |
| 2017/4/10 | මුදල් මිලදී ගැනීම් | V.No. 03 | 18,000 |
| 20X7/4/12 | මාසික රක්ෂණ ගෙවීම් | V.No. 04 | 12,000 |
| 20X7/4/14 | ණයහිමි සාගර වෙත ගෙවීම් | V.No. 05 | 16,000 |
| | සාගර වෙතින් ලද වට්ටම් | | 1,000 |
| 20X7/4/15 | බැංකු ණය ලැබීම් | R.No 03 | 100,000 |
| 20X7/4/16 | කාර්යාලීය ගෘහභාණ්ඩ මිලදී ගැනීම් | V.No. 06 | 50,000 |

| | | | |
|---|---|---|---|
| 20X7/4/18 | ණයගැති අමල්ගෙන් ලද මුදල | R.No 04 | 9,000 |
| 20X7/4/18 | අමල්ට දුන් වට්ටම | | 500 |
| 20X7/4/18 | වැටුප් සහ වේතන | V.No. 07 | 30,000 |
| 20X7/4/20 | මුදලට විකුණුම් | R.No 05 | 50,000 |
| 20X7/4/22 | මුදලට මිල ගැනීම් | V.No. 08 | 22,000 |
| 20X7/4/22 | ණයගැති ශාන්ගෙන් ලද මුදල | R.No 06 | 48,000 |
| 20X7/4/22 | ශාන්ට දුන් වට්ටම | | 2,000 |
| 20X7/4/25 | ලද කොමිස් මුදල | R.No 07 | 1,000 |
| 20X7/4/26 | ගැනිලි | V.No. 09 | 5,000 |
| 20X7/4/28 | ප්‍රාග්ධන යෙදවීම් | R.No 08 | 20,000 |

**ඉහත ගනුදෙනු මුදල් ලැබීම් ජර්නලය සහ මුදල් ගෙවීම් ජර්නලය තුල වාර්තා කරන්න**

JMC vLearning
"your virtual learning partner"

# මුදල් පාලන ගිණුම

ව්‍යාපාරයේ මුදල් ලැබීම් සහ ගෙවීම් වාර්තා කරන පොදු ලෙජරයේ ගිණුම මුදල් ගිණුම වේ.
මෙය මුදල් පාලන ගිණුම ලෙසද හදුන්වයි
මුදල් ලැබීම් ජර්නලයේ විශ්ලේෂණාත්මක තීරු මුදල් ගිණුමට හර වන අතර මුදල් ගෙවීම් ජර්නලයේ විශ්ලේෂණාත්මක තීරු මුදල් ගිණුමට බැර වේ






# මුදල් පාලන ගිණුම

මුදල් ලැබීම් ජර්නලයේ විශ්ලේෂණාත්මක තීරු

**මුදල් පාලන ගිණුම**

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගේ | 50,000 | ගැනුම් | 5,000 |
| විකුණුම් | 25,000 | ණයහිමියෝ | 45,000 |
| ණයගැතියෝ | 19,500 | විදුලිය | 10,000 |
| ණය ලැබීම් | 50,000 | ශේෂය | 84,500 |
| | 144,500 | | 144,500 |
| ශේෂය ඉ/ගේ | 84,500 | | |

මුදල් ගෙවීම් ජර්නලයේ විශ්ලේෂණාත්මක තීරු



JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න 02


දමිත් විසින් රු. 800,000ක් අයෝජනය කරමින් අප්‍රේල් මස 01 වනදා ව්‍යාපාරය ආරම්භ කරන ලදි. පහත ගනුදෙනු අප්‍රේල් මාසය තුළ සිදුවී ඇත. පහත ගනුදෙනුව මුදල් ලැබීම් සහ ගෙවීම් ජර්නලයේ සටහන් කර ලෙජර් ගිණුම්වල වාර්තා කරන්න

| දිනය | විස්තරය | රිසිට් අංකය | වවුචර් අංකය | Chq. No. | Rs. |
|---|---|---|---|---|---|
| 20X7.04.01 | මුදලට ගැනුම් | | 1 | 800400 | 120,000 |
| 20X7.04.02 | ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | | 2 | 800401 | 80,000 |
| 20X7.04.02 | මුදල් විකිණීම | 2 | | 712520 | 200,000 |
| 20X7.04.03 | අතුලගෙන් ණයට ගැනුම් | | | | 100,000 |
| 20X7.04.04 | වෙනුරට ණයට විකිණීම | | | | 150,000 |
| 20X7.04.05 | සුළු මුදල් අයකැමි වෙත ගෙවීම | | 3 | 800402 | 10,000 |
| 20X7.04.06 | ප්‍රවාහනය | | 4 | 800403 | 5,000 |
| 20X7.04.07 | තුෂාන්ගෙන් ණයට ගැනුම් | | | | 80,000 |

| දිනය | විස්තරය | රිසිට් අංකය | වවුචර් අංකය | Chq. No. | Rs. |
|---|---|---|---|---|---|
| 20X7.04.08 | චතුරට ණය විකුණුම් | | | | 90,000 |
| 20X7.04.08 | මහජන බැංකුවෙන් ලබා ගත් ණය | 3 | | | 300,000 |
| 20X7.04.09 | රු. 5,000 ක වට්ටම අඩු කළ පසු ණයහිමි අතුලට ගෙවූ මුදල | | 5 | 800404 | 95,000 |
| 20X7.04.10 | 10% වට්ටම අඩු කිරීමෙන් පසු වෙනුරගෙන් ලද මුදල | 4 | | 620703 | 135,000 |
| 20X7.04.12 | මුදලට විකිණීම | 5 | | cash | 250,000 |
| 20X7.04.14 | ගෙවන ලද ගොඩනැගිලි කුලිය | | 6 | 800405 | 20,000 |
| 20X7.04.15 | මුදලට ගැනුම් | | 7 | 800406 | 110,000 |
| 20X7.04.18 | තුෂාන්ට ගෙව්වා- වට්ටම් 10% ලැබිණි | | 8 | 800407 | 72,000 |
| 20X7.04.22 | චතුරගෙන් ලැබීම් දුන් වට්ටම් 10% | 6 | | cash | 81,000 |
| 20X7.04.25 | ගෙවූ වැටුප් | | 9 | 800408 | 10,000 |
| 20X7.04.26 | ගැනිලි | | 10 | 800409 | 10,000 |
| 20X7.04.28 | කොමිස් ආදායම් | 7 | | cash | 8,000 |

IMC vLearning
your virtual learning partner

# සුළු මුදල් ජර්නලය




වයාපාරයක සුළු මුදල් භාරකරු විසින් සුළු මුදල් අග්‍රිමයෙන් කරන සියළුම සුළු වියදම් වාර්තා කිරීමට සුළු මුදල් ජර්නලය භාවිතා කරයි



JMC vLearning "your virtual learning partner"

# ප්‍රධාන ගණකාධිකාරී සහ සුළු මුදල් භාරකරු



# සුළු මුදල් වියදම් සඳහා උදාහරණ



ගමනාගමනය



සුභසාධනය



තැපැල්



පිරිසිදු කිරීම්





# සුළු මුදල් අග්‍රිම ක්‍රමය


ව්‍යාපාරයක සියළුම වියදම් චෙක්පත් හෝ ප්‍රේෂණ තුලින් සිදු කිරීම එතරම් ප්‍රායෝගික නොවේ. බස් ගාස්තු, ත්‍රී රෝද රථ ගාස්තු, ලිපි ද්‍රව්‍ය, තැපැල්, නඩත්තු වියදම්, සුබ සාධන වියදම් වැනි එදිනෙදා සිදුවන මුදලින්ම දැරීමට සිදුවන සුළු වියදම් තිබේ.

ව්‍යාපාර මෙම සුළු වියදම් පාලනය කිරීමට සුළු මුදල් අග්‍රිම ක්‍රමය භාවිතා කරයි. මෙහිදි යම් කාලච්ඡේදයක් සඳහා වන සුළු මුදල් වියදම් තක්සේරු කරයි. එය සුළු මුදල් අග්‍රිමය ලෙස හදුන්වයි. ව්‍යාපාරයේ ප්‍රධාන ගණකාධිකාරී විසින් කාලච්ඡේදය ආරම්භයේදි සුළු මුදල් අග්‍රිමය සුළු මුදල් භාරකරුට ලබා දෙනු ලබයි.

සුළු මුදල් භාරකරු එම අග්‍රිමයෙන් සුළු වියදම් සඳහා මුදල් ලබා දේ. එම සෑම වියදමක් සඳහාම සුළු මුදල් වව්චරයක් නිකුත් කෙරෙන අතර, එය සුළු මුදල් ජර්නලය තුල වාර්තා කෙරේ. කාලච්ඡේදය අවසානයේ සුළු මුදල් වියදම් වාර්තාව සුළු මුදල් භාරකරු විසින් ප්‍රධාන මුදල් භාරකරුට යවන අතර, එම මුදල ඊළඟ කාලච්ඡේදයේ මුල සුළු මුදල් භාරකරුට ප්‍රතිපූරණය කෙරේ. එනම් සෑම විටම සුළු මුදල් භාරකරු සතුව තිබෙන අතැති මුදල සහ සුළු මුදල් වියදම් එකතුව සුළු මුදල් අග්‍රිමයට සමාන වේ.




# සුළු මුදල් අග්‍රිම ක්‍රමය භාවිතා කරමින් සුළු මුදල් කළමනාකරණය



# සුළු මුදල් ජර්නලයේ වැදගත්කම









| මුදල් ගෙවීම් ජර්නලයේ සංකීර්ණබව අඩු කරගත හැකි වීම | සුළු වියදම් විශ්ලේෂණය කිරීමට හැකි වීම | සුළු වියදම් පාලනය කිරීමට හැකි වීම | ප්‍ර. ගණකාධිකාරීගේ වැඩ අඩු කර ගැනීමට හැකි වීම |
|---|---|---|---|



JMC vLearning "your virtual learning partner"

# සුළු මුදල් ජර්නල ආකෘතිය

| දිනය | සුළු මුදල් වව්චර අංකය | විස්තරය | වටිනාකම රු. | විශ්ලේෂණ තීරු | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | ලිපිද්‍රව්‍ය රු. | සුභසාධක රු. | ගමන් වියදම් රු. | වෙනත් රු. | ලෙජර් පිටුව |
| 1/1/X1 | 125 | බස් ගාස්තු | 50 | | | 50 | | GL05 |
| 2/1/X1 | 126 | ත්‍රීවිලර් | 300 | | | 300 | | GL05 |
| 3/1/X1 | 127 | කිරි පැකට් | 1,000 | | 1,000 | | | GL06 |
| 4/1/X1 | 128 | A4 කොළ | 1,500 | 1,500 | | | | GL07 |
| 5/1/X1 | 129 | සේවක ගාස්තු | 500 | | | | 500 | GL08 |
| | | | 3,350 | 1,500 | 1,000 | 350 | 500 | |

# සුළු මුදල්වලට අදාළ ද්විත්ව සටහන්

**ප්‍රධාන ගණකාධිකාරීගෙන් සුළු මුදල් අග්‍රිමය ලැබුණු විට හෝ ප්‍රතිපූරණය වූ විට**

සුළු මුදල් ගිණුම හර
මුදල් ගිණුම බැර

**සුළු මුදලින් කරන වියදම්**

අදාළ වියදම් ගිණුම හර
සුළු මුදල් ගිණුම ණය

Sandeepa Jayasekera - JMC 69

JMC vLearning
your virtual learning partner

# ප්‍රශ්න 04

වයාපාරයේ සුළු මුදල් අග්‍රිමය මාසයකට රු. 1,000කි. 2024 වර්ෂයේ පසුගිය මාස 3ක සුළු වියදම ඔබට ලබා දි ඇත. ඒ ඒ මාසයේ සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය ගණනය කරන්න.

| මාසය | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|
| සුළු වියදම | 800 | 750 | 500 |
| ඉතිරි අගය | 200 | 250 | 500 |

## ප්‍රශ්න 05

සීනුගේ ව්‍යාපාරයේ අගෝස්තු මාසයේ සුළු මුදලින් කළ වියදම රු. 2,500කි. සුළු මුදල් අග්‍රිමය රු. 6,000ක් වේ. සැප්තැම්බර් මාසයේදි සුළු මුදල් අග්‍රිමය රු. 1,000කින් වැඩි කළේ නම්, ගණකාධිකාරී විසින් ප්‍රතිපූරණය කරන සුළු මුදල් අග්‍රිම මුදල ගණනය කරන්න.

JMC vLearning
"your virtual learning partner"

## ප්‍රශ්න 06

රාජාගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 30,000කි. පහත ගනුදෙනු සුළු මුදල් ජර්නලය තුල වාර්තා කරන්න

| | |
|---|---|
| 01 ජූලි 20X1 | අග්‍රිමය රු. 30,000 ලබා දෙන ලදී |
| 02 ජූලි 20X1 | ලිපිද්‍රව්‍ය රු. 2,500 |
| 03 ජූලි 20X1 | සීනි හා තේ කොළ රු. 3,500 |
| 05 ජූලි 20X1 | බස් වියදම් රු. 500 |
| 11 ජූලි 20X1 | මුද්දර ගාස්තු රු. 400 |
| 15 ජූලි 20X1 | A4 බන්ඩල් රු. 3,000 |
| 16 ජූලි 20X1 | පිරිසිදු කිරීමේ ගාස්තු රු. 5,000 |
| 20 ජූලි 20X1 | ටැක්සි ගාස්තු රු. 1,600 |
| 24 ජූලි 20X1 | තැපැල් රු. 400 |
| 28 ජූලි 20X1 | පාර්සල් ගාස්තු රු. 2,500 |
| 30 ජූලි 20X1 | ආහාරපාන රු. 3,000 |
| 31 ජූලි 20X1 | අග්‍රිමය ප්‍රතිපූරණය කරන ලදී |

# ප්‍රශ්න 07

බයිසන්ගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 1,500කි. පහත ගනුදෙනු සුළු මුදල් ජර්නලය තුල වාර්තා කර ලෙජරයට පිටපත් කරන්න

| | |
|---|---|
| 01 ජූලි 20X4 | අග්‍රිමය රු. 1,500ක් ප්‍රතිපූරණය කරන ලදී |
| 02 ජූලි 20X4 | ලිපිද්‍රව්‍ය රු. 50 |
| 03 ජූලි 20X4 | සීනි හා තේ කොළ රු. 35 |
| 05 ජූලි 20X4 | බස් ගාස්තු රු. 45 |
| 11 ජූලි 20X4 | මුද්දර ගාස්තු රු. 15 |
| 15 ජූලි 20X4 | මුද්‍රණ ගාස්තු රු. 20 |
| 20 ජූලි 20X4 | ටැක්සි ගාස්තු රු. 60 |
| 24 ජූලි 20X4 | තැපැල් ගාස්තු රු. 50 |
| 28 ජූලි 20X4 | පිරිසිදු කිරීමේ වියදම් රු. 25 |
| 29 ජූලි 20X4 | සේවකයන්ට ගෙවීම රු. 100 |
| 31 ජූලි 20X4 | සුළු මුදල් අග්‍රිමය රු. 1,000කින් වැඩිකර ප්‍රතිපූරණය කරන ලදි |

JMC vLearning "your virtual learning partner"